JMC vLearning
"your virtual learning partner"

නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම

AAT අදියර I
ECN - ආර්ථික විද්‍යාව

ප්‍රසාද් බාලසූරිය
LICA

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

04. නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම

ආවරණය වන උපමාතෘකා

4-1 නිෂ්පාදන ආයතන හඳුනා ගැනීම

4-2 නිෂ්පාදනය හඳුනා ගැනීම

4-3 නිෂ්පාදන කාලය

4-4 නිෂ්පාදන පිරිවැය හැඳින්වීම

4-5 ආයතනයක ලාභ උපරිම කිරීම

4-5 ප්‍රශ්න පොතට

4.1 නිෂ්පාදන ආයතන හඳුනා ගැනීම

නිෂ්පාදන සම්පත් එකට මුසු කරමින් මිනිස් අවශ්‍යතා සපුරාලීම පිණිස, ආර්ථිකයක් තුල භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරමින්, වෙළඳපොලට සපයන ආයතන, ''නිෂ්පාදන ආයතන'' ලෙස හඳුන්වයි. එම නිෂ්පාදන ආයතන විවිධ රූපයන්ගෙන් යුක්ත වේ.

* තනි පුද්ගල ව්‍යාපාර
* හවුල් ව්‍යාපාර
* සංස්ථාපිත සමාගම්
* සමූපකාර
* රාජ්‍ය ව්‍යවසාය

නිෂ්පාදන ආයතනයන්හි මූලික අරමුණ වන්නේ ලාභය වුවද, එක් එක් නිෂ්පාදන ආයතනයන්හි අපේක්ෂිත ලාභයේ වෙනස්කම් පවතී.

4.2 නිෂ්පාදනය හඳුනා ගැනීම

* නිෂ්පාදන සම්පත්, භාණ්ඩ හා සේවා බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය නිෂ්පාදනය ලෙස හඳුන්වයි.

* මෙහිදී යෙදවුම්, කිසියම් තාක්ෂණික ක්‍රම වේදයක් ඔස්සේ නිමැවුම් බවට පරිවර්තනය කෙරෙන අතර, යෙදවුම් හා නිමැවුම් අතර ඇති සම්බන්ධතාවය පහත ශ්‍රිතය තුලින් පෙන්නුම් කෙරේ.

Q = F (L, K)

Q - නිමැවුම
F - ශ්‍රිතයන් වේ
L - ශ්‍රමය
K - ප්‍රාග්ධනය

* මෙහිදී අදහස් වන්නේ භාණ්ඩයක නිමැවුම, ශ්‍රමය හා ප්‍රාග්ධනය යන යෙදවුම් මත රඳා පවතින බවයි.

4.3 නිෂ්පාදන කාලය

නිෂ්පාදන සාධකවල හැසිරීම පදනම් කරගෙන, නිෂ්පාදන කාලය ප්‍රධාන කොටස් දෙකකට බෙදයි.
1. කෙටි කාලය
2. දිගු කාලය

1. කෙටි කාලය
   - ✓ ස්ථාවර හා විචල්‍ය වශයෙන් සාධක දෙකක් පැහැදිලිව වෙන් කර හඳුනාගත හැකි කාලයයි.
   - ✓ මෙහිදී නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමට හැකි වන්නේ විචල්‍ය සාධක ඉහළ නැංවීම තුලිනි.
   - ✓ කෙටි කාලයේ ස්ථාවර සාධක පවතින හෙයින් ස්ථාවර පිරිවැයක් ද, විචල්‍ය සාධක පවතින හෙයින් විචල්‍ය පිරිවැයක් ද පවති.
   - ✓ කෙටි කාලයේ පිරිවැය හැසිරීමට හේතුව වන්නේ, හීනවන ආන්තික ඵලදාවයි.

හීනවන ආන්තික ඵලදාව යනු,

----

2. දිගු කාලය
   - ✓ දිගු කාලය තුළ කිසිදු ස්ථාවර යෙදවුමක් දක්නට නොලැබෙන අතර, සියළු සාධක විචල්‍ය වේ.
   - ✓ එබැවින් නිෂ්පාදකයාට සිය නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමට පුළුල් ඉඩකඩක් පවති.
   - ✓ දිගු කාලය විචල්‍ය සාධක පමණක් පවතින බැවින් ස්ථාවර පිරිවැයක් දැකිය නොහැකි අතර, දැකිය හැකි වන්නේ විචලය පිරිවැයක් පවතී.
   - ✓ දිගු කාලයේ පිරිවැයේ හැසිරීමට හේතුව වන්නේ, වැඩෙන, හීනවන හා ස්ථාවර පරිමානුකූල ඵලයි.

පරිමානුකූල ඵල

- ✓ දිගු කාලයේදී සියළු යෙදවුම් වෙනස් කරමින් නිෂ්පාදනය සිදු කරන විට නිෂ්පාදනය හැසිරෙන ආකාරය පරිමානුකූල ඵල තුලින් විස්තර කෙරේ.

- ✓ පරිමානුකූල ඵල ප්‍රධාන වර්ග 03 ක්.
  1. ස්ථාවර පරිමාණුකූල ඵල
  2. වැඩෙන පරිමාණුකූල ඵල
  3. හීනවන පරිමාණුකූල ඵල

- ✓ ස්ථාවර පරිමාණුකූල ඵල යනු,

උදා: යෙදවුම් 20% කින් වැඩි කරන විට, නිමැවුම් 20% කින් වර්ධනය වේ.

✓ වැඩෙන පරිමාණුකූල ඵල යනු,

උදා: යෙදවුම් 20% කින් වැඩි කරන විට, නිමැවුම් 50% කින් වැඩි වීම.

වැඩිවන පරිමාණුකූල ඵල හට ගැනීමට බලපාන හේතු කිහිපයකි.

✓ ---

✓ ---

✓ ---

✓ ---

✓ හීනවන පරිමාණුකූල ඵල යනු,

උදා: යෙදවුම් 20% කින් වැඩි කරන විට, නිමැවුම් 15% කින් වැඩි වීම.

අඩුවන පරිමානුකූල ඵල හට ගැනීමට බලපාන හේතු කිහිපයකි.

✓ ---

✓ ---

✓ ---

✓ ---

නිෂ්පාදිතය සම්බන්ධ මූලික සංකල්ප කිහිපයක්

1. **මුළු නිෂ්පාදිතය (Total Prodcution)**
   ස්ථාවර හා විචල්‍ය සාධක සේවයේ යෙදවීම තුලින් නිෂ්පාදනය කරන මුළු ඒකක ප්‍රමාණය මුළු නිෂ්පාදිතය ලෙස හඳුන්වයි.

2. **සාමාන්‍ය නිෂ්පාදිතය (Average Prodcution)**
   මුළු නිෂ්පාදන ප්‍රමාණය, ඒ සඳහා සේවයේ යෙදවූ විචල්‍ය සාධක ඒකක ගණනින් බෙදීමෙන් සාමාන්‍ය නිෂ්පාදිතය ගණනය කරයි.

3. **ආන්තික නිෂ්පාදිතය (Marginal Prodcution)**
   විචල්‍ය සාධකය එක් ඒකකයකින් වැඩි කරන විට මුළු නිෂ්පාදන ප්‍රමාණයේ ඇති වන වෙනස් වීම ගණනය කරයි.

JMC vLearning "your virtual learning partner"

කල්පිත පිරිවැය දත්ත කිහිපයක් පහත දැක්වේ.

VF	TP	AP	MP
1	6	---------------------------	---------------------------
2	20	---------------------------	---------------------------
3	48	---------------------------	---------------------------
4	72	---------------------------	---------------------------
5	80	---------------------------	---------------------------
6	84	---------------------------	---------------------------
7	84	---------------------------	---------------------------
8	80	---------------------------	---------------------------

ඉහත දත්ත මත TP, MP හා AP වක්‍ර ගොඩ නගන්න.

JMC vLearning
"your virtual learning partner"

ඉහත වක්‍ර මත පහත තත්ත්වයන් අවබෝධ කර ගත හැක.

4.4 නිෂ්පාදන පිරිවැය හැඳින්වීම

නිෂ්පාදන පිරිවැය යනු, නිෂ්පාදනය සඳහා දරන්නට සිදුවන සියළු වියදම්වල මූල්‍යමය වටිනාකම වේ.

ගණකාධිකරණ පිරිවැය / ඍජු පිරිවැය

- නිෂ්පාදන සාධක සඳහා මුදලින් දරන වියදම් වේ.
- මෙය සත්‍ය වශයෙන් මුදලින් දරන බැවින් මුදල් පිරිවැය, ගෙවුණ පිරිවැය හෝ ප්‍රත්‍යක්ෂ පිරිවැය ලෙසද මෙය හඳුන්වයි.
- උදාහරණ:

ආර්ථික පිරිවැය

- එනම්, ප්‍රත්‍යක්ෂ පිරිවැයට, ආරෝපිත පිරිවැය එක් කිරීමෙන් සෑදෙන පිරිවැයයි.
- ආර්ථික පිරිවැය = ගිණුම්කරණ පිරිවැය + ආරෝපිත පිරිවැය

සාමාන්‍යයෙන් දක්නට ලැබෙන පිරිවැය සංකල්ප කිහිපයකි.

1. **මුළු ස්ථාවර පිරිවැය (Total Fixed Cost)**
   - නිෂ්පාදනය කරන ඒකක ප්‍රමාණය සමඟ වෙනස් නොවන
   - නිෂ්පාදනය ශූන්‍යයේ දී වුවද දැරීමට වන පිරිවැයයි.

   උදාහරණ:

JMC vLearning "your virtual learning partner"

2. මුළු විචල්‍ය පිරිවැය (Total Variable Cost)

- නිෂ්පාදනය කරන ඒකක ප්‍රමාණය අනුව වෙනස් වන
- නිෂ්පාදනය ශූන්‍යයේදී දැරීමට වන සිදු නොවන පිරිවැයයි.

උදාහරණ:

----

3. මුළු පිරිවැය (Total Cost)

- නිෂ්පාදනය සඳහා දරන මුළු වියදම්වල එකතුව වේ.
- එනම් ස්ථාවර හා විචල්‍ය පිරිවැයවල එකතුව වේ.



4. ආන්තික පිරිවැය (Marginal Cost)

✓ නිෂ්පාදන කාර්යයේදී තම ඒකකයක් නිෂ්පාදනය කිරීම හේතුවෙන් මුළු පිරිවැයට අළුතින් එකතුවන ප්‍රමාණය වේ.

✓ ආන්තික පිරිවැය ගණනය කරන්නේ,

$$MC = \frac{\Delta TC}{\Delta Q}$$

සාමාන්‍ය පිරිවැය සංකල්ප

සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) $= \frac{\text{මුළු ස්ථාවර පිරිවැය}}{\text{නිමැවුම් ඒකක}}$

සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) $= \frac{\text{මුළු විචල්‍ය පිරිවැය}}{\text{නිමැවුම් ඒකක}}$

සාමාන්‍ය පිරිවැය (AC) $= \frac{\text{මුළු පිරිවැය}}{\text{නිමැවුම් ඒකක}}$

JMC vLearning "your virtual learning partner"

කෙටි කාලීන පිරිවැය වක්‍ර

කෙටි කාලීන පිරිවැය වක්‍ර පහත පරිදි දැක්විය හැක. ආන්තික පිරිවැය වක්‍රය, සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය, සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය පහත පරිදි දැක්විය හැකිය.

ඒ අනුව පහත නිගමනයන් මෙලෙස පෙලගැස්විය හැක.

- AC වක්‍රයේ අවම ලක්ෂයේදී MC ඡේදනය කරයි.
- AC අවම වන විට AC = MC වේ.
- AC අඩුවන විට MC එයට වඩා අඩුවන අතර, AC ඉහළ යන විට MC එයට වඩා වැඩි වේ.
- කෙටි කාලීන පිරිවැයේ හැසිරීමට හේතුව වන්නේ හීනවන ආන්තික ඵලදාවයි.

දිගු කාලීන පිරිවැය වක්‍ර

- දිගු කාලීන පිරිවැය වක්‍රය, ඉංග්‍රීසි යූ (U) අකුරක හැඩය ගනී. එයට හේතු වන්නේ වැඩෙන, හීනවන හා ස්ථාවර පරිමාණුකූල ඵලයි.
  එනම්, ව්‍යාපාරයේ පරිමාණය විශාල වීම මත ලබා ගත හැකි මහා පරිමාණ පිරිමැසුම් හේතුවෙන් දිගු කාලීන පිරිවැයේ හැසිරීම තීරණය වේ.



JMC vLearning "your virtual learning partner"

පිරිවැය වක්‍ර ඇසුරින් ව්‍යාපාර තීරණ ගැනීම

සාමාන්‍ය පිරිවැය වක්‍රය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය හා ආන්තික ආදායම් වක්‍රය පහත පරිදි පෙන්නුම් කළ හැක.



- නිෂ්පාදනය සඳහා යෝග්‍ය වන්නේ, අලෙවි කල හැකි මිල, සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉක්මවන්නේ නම් පමණි.
- මිල, සාමාන්‍ය පිරිවැයට සමාන වන විට සමච්ඡේද ලක්ෂය ලඟා කර ගනී.
- මිල, සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන මිල "වසා දැමීමේ ලක්ෂය" ලෙස හඳුන්වයි. මන්දයත්, අවම සාමාන්‍ය විචල්‍ය විචල්‍ය පිරිවැයවත් මිල මඟින් ආවරණය නොවන්නේ නම්, ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම නිෂ්ඵල, අලාභදායී කටයුත්තක් වන බැවිනි.

4.5 ආයතනයක ලාභ උපරිම කිරීම

ලාභය නිර්වචනය කිරීමේදී ප්‍රධාන දෘෂ්ඨි කෝණ දෙකක් ඔස්සේ සාකච්ඡා කළ හැකිය.

1. ගිණුම්කරණ ලාභය

----

2. ආර්ථික ලාභය

JMC vLearning "your virtual learning partner"

ආර්ථික ලාභය ප්‍රධාන වශයෙන් පහත පරිදි හඳුනාගත හැක.

1. ආර්ථික ලාභය 0 වන්නේ නම් එය ප්‍රාමාණික ලාභ ලබන තත්ත්වයකි.
2. ආර්ථික ලාභය ධන අගයක් ගන්නේ නම්, එය නිෂ්ප්‍රාමාණික ලාභ ලබන තත්ත්වයකි.
3. ආර්ථික ලාභය ඍණ අගයක් ගන්නේ නම්, එය අලාභදායී තත්ත්වයකි.

කෙසේවෙතත් ආර්ථික විද්‍යාවේදී ලාභ උපරිම වන නිමැවුම් මට්ටම නැතහොත් ප්‍රශස්ත නිමැවුම හඳුනා ගන්නේ, ආන්තික ආදායම, ආන්තික පිරිවැයට සමාන වන නිමැවුම් මට්ටමයි.

4.6 ප්‍රශ්න පොතට

1. **මුළු නිෂ්පාදනය, සාමාන්‍ය නිෂ්පාදනය හා ආන්තික නිෂ්පාදනය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (2018 ජූලි)**

2. **------------------ ශුන්‍ය වන විට මුළු නිෂ්පාදනය උපරිමය. (2018 ජනවාරි)**

3. **පරිමාණකූල පිරිමැසුම් වර්ග 03 පැහැදිලි කරන්න. (2017 ජූලි)**

4. **නිෂ්පාදනය හා පිරිවැය සම්බන්ධයෙන් කෙටි කාලය හා දිගු කාලය අතර වෙනස සටහන් කරන්න. (2017 ජනවාරි)**

5. **හීනවන ආන්තික ඵලදාව කෙටියෙන් හඳුන්වන්න.**

JMC vLearning "your virtual learning partner"

අමතර සටහන්

JMC vLearning "your virtual learning partner"

JMC vLearning
"your virtual learning partner"

JMC vLearning
"your virtual learning partner"